මැදවච්චිය ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 21 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 10 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ලද ව්‍යාපෘති 10 කට අදාළ ප්‍රාග්ධන ලැබීම් හා වියදම් රු.17,546,351 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වර්ෂයට අදාල සියළු ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි |
| (ii) | සභාවට ලැබී තිබුණු පුරනැඟුම කඩ කාමර තැන්පත් රු.6,803,877 ක් වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර එම මුදල් තැන්පත් කර තිබුණු බැංකු ගිණුම පමණක් වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ගිවිසුම්ගත ව්‍යාපෘති 13 කට අදාළව ණයගැති හා ණයහිමි වටිනාකම් රු.7,403,230 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වර්ෂයට අදාල සියළු ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම් ගත කළයුතු වේ. | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ කර්මාන්ත ගිණුම්ගත වී නොමැති බැවින් එම ශේෂ ගිණුම්ගත කිරිමට කටයුතු කළයුතු කරමි. |
| (iv) | මැදවච්චිය නව පොදු වෙළඳ සංකීර්ණයට අදාළ කඩ කාමර 46 ක සමාලෝචිත වර්ෂයේ ආදායම රු.8,253,000 ක් හා 2017 සහ 2018 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු හිඟ කුලී රු.10,997,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 වර්ෂයේ ආරම්භක ගිණුම් තැබීමේදී නිවැරදිව ගිණුම්ගත කරමි. |
| (v) | උපලබ්ධි නොවූ තැන්පතු දෙකක සහ අධිගෙවීම් අයකරගැනීම් තුනක වටිනාකම රු.217,180 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට රාජ්‍ය ආදායම් ගිණුම නමින් ණයහිමි වගකීමක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී යම් ගැටළුකාරී තත්ත්වයක් මතු වුවහොත් එම තත්ත්වය නිරවුල් කිරීමට සිදුවන බැවින් එම වටිනාකම් වගකීමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කලෙමි. 2020 වර්ෂයේ දී සමුච්චිත අරමුදලට එම ශේෂයන් බැර කර ගැනීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ රු.516,270 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.782,170 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.265,900 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.222,000 ක අගරු චෙක්පත් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | මෙම වර්ෂයේදී අගරු චෙක්පත් වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 06 කට අදාළ ලේඛන අනුව වටිනාකම රු.1,942,028 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.8,167,511 ක් වූ බැවින් රු.6,225,483 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | කරුණු සලකා බලා නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.10,795,878 ක් වුවද එදිනට ශේෂ සනාථ කිරීම් අනුව එම ණය ශේෂය රු.10,402,103 ක් වුයෙන් රු.393,775 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | දේශීය ණය සංවර්ධන අරමුදල සමඟ සාකච්ඡා කර ශේෂ සහතික සහ ගෙවීමට ඇති ණය වාරික පිළිබඳව නිරවුල් විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පත්වලින් අඩුකිරීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.5,269,714 ක් වූ ලැබිය යුතු තැන්පත් ගිණුම් 02 ක අසාමාන්‍ය අවිනිශ්චිත ශේෂයන් සම්බන්ධව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කර නිරවුල් කර නොතිබුණි. | ඒ පිළිබඳව සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම් නිරවුල් කළයුතු වේ. | පිළිගනිමි.<br><br>මේ පිළිබඳව පෙර වර්ෂ වල තොරතුරු සොයා බලා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,631,149 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් වසර 05 ක් ඉක්මවූ කාලයක සිට පැවත එමින් තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. මේ පිළිබඳව පෙර වර්ෂ වල තොරතුරු සොයා බලා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 2,618,325 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් වසර 10 ක් ඉක්මවූ කාලයක සිට පැවත එමින් තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | පූර්ව වර්ෂවලදී සභාවට ලැබී තිබුණු වැට් බදු රු.26,218 ක් හා මුද්දර බදු රු.32,647 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම් කර නිරවුල් කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.592,480,467 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත | | | | |
| | i. 99(1) හා 104 (1) වගන්ති | - | සභාව සතුව පැවති වාහන 07 ක් රක්ෂණ බලපත්‍ර ලබානොගෙන ධාවනයේ යොදවා තිබුණි. | පනතේ අදාල වගන්ති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |
| | ii. 25(1) වගන්තිය | - | සභාව සතුව පැවති වාහන 08 ක් ආදායම් බලපත්‍ර ලබානොගෙන ධාවනයේ යොදවා තිබුණි. | පනතේ අදාල වත්කම් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 1980 අංක 47 දරන පාරිසරික පනතට අනුව නිකුත් කල අංක 1533/16 හා 2008/01/25 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | | සියඹලාගස්කඩ, මුස්ලිම් හල්මිල්ලෑව යන ගව ඝාතකාගාර සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගැනිම කටයුතු කළයුතු වේ. | ගවඝාතකාගාර සඳහා පරිසර බලපත්‍ර ලබාගැනීමට උපදෙස් දී ඇත. |
| (ඇ) | 1988 අගෝස්තු 23 දිනැති සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාවේ 09 වගන්තිය | 1,042,660 | සභා බලප්‍රදේශයේ ගව ඝාතකාගාර වල ඝාතනය වන සතුන් පරීක්ෂා කිරීම හා නිල ලකුණු සටහන් කිරීම වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගාස්තු අය කිරීමට කටයුතු කළයුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් මුදල මහ සභා තීරණයක් ගෙන ගැසට් කර අදාල ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 | 222,000 | 2019 පෙබරවාරි මස අගරු කර තිබුණු චෙක්පතක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මෙම වර්ෂයේදී අගරු චෙක්පත් වටිනාකම නරවුල් කිරීමට කරමි. |
| (ඉ) | 2016 දෙසැම්බර් 27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 වගන්තිය | | සභාව සතු වාහන 03 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ඊ) | 2002 ජුලි 24 දිනැති උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 20/2002 දරන චක්‍රලේඛය | 78,910 | වීථි රේඛා, ගොඩනැගිලි අනුබෙදුම් මත අයකරන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 50 ක් අදාළ නිලධාරීන්ට ගෙවීම වෙනුවට අයකර තිබුණු මුළු මුදලම ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,093,356 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.320,733 ක් විය .

2.2 මූල්‍ය පාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම් | 2019 බිල්කල ආදායම | 2019 රැස්කල ආදායම් | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කල ආදායම | 2018 රැස්කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,309,558 | 859,724 | 780,023 | 1,281,522 | 2,258,910 | 2,266,365 | 2,179,640 | 1,201,821 |
| (ii) | කුලී | 17,503,600 | 5,588,110 | 5,503,849 | 2,091,277 | 13,283,400 | 6,027,630 | 6,387,150 | 2,007,016 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 5,486,450 | 6,197,926 | 6,197,926 | 505,700 | 4,776,560 | 5,178,613 | 5,178,613 | 505,700 |
| (iv) | වෙනත් ආදායම් | 2,304,318 | 4,211,033 | 3,168,679 | 3,163,575 | 2,316,285 | 2,226,392 | 7,652,004 | 2,121,221 |
| | | 27,603,926 | 16,856,793 | 15,650,477 | 7,042,074 | 22,635,155 | 15,699,000 | 21,397,407 | 5,835,758 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාරව ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් හා දේපළ තහනම් කිරීමේ ලයිස්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී පිළියෙල කර නොතිබුණි. | රීති 33 ප්‍රකාරව හිඟ අයකර ගැනීමට හා පැහැරහැරීම් සම්බන්ධව නීතිමය පියවර ගැනීම කළයුතු වේ. | පෙර වර්ෂවල සිට පැවත එන හිඟයකි. වර්තමානයේ වරිපනම් නව තක්සේරුවක් කර ගැනීමට GPRS තාක්ෂණය යොදා වරිපනම් කලාපය සිතියම් ගත කර ඇත. |
| (ආ) 2005 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් අයකිරීම නිසා අතර මෙපිට කාලපරිච්ඡේදයේ නව ඉදිකිරීම්, සංශෝධන ආදිය මත වරිපනම් අය කිරීම මගහැරී තිබුණි. | සංශෝධන සිදුකර ගාස්තු අය කිරීම සිදුකළ යුතු වේ. | පිළිතුරු සපයා නැත. |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 39 කින් ලැබිය යුතු රු.777,123 ක් හා මස් හා මාළු කඩවලින් අයවිය යුතු රු.1,314,153 ක් අයකරගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කර ගාස්තු අයකර ගැනීම සිදුකළ යුතුවේ. | පෙර වර්ෂ වල සිට පැවත එන ශේෂය 1,037,693 කි. පෙර වර්ෂවල පැවත එන හිඟ ශේෂයන් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවා අදාල කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. පවත්නා වර්ෂයේ හිඟ මුදලින් කොටසක් මේ වන විට අය කර ගෙන ඇත. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බලප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ලේඛන යාවත්කාලීව පවත්වාගෙන ගාස්තු අයකළ යුතු වේ. | බල ප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු පිළිබඳ ලේඛනයක් නඩත්තු කරන අතර, අදාල ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 සිට 2019 දක්වා වර්ෂවලට අදාළව ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. 2017, 2018, 2019 වර්ෂ සඳහා සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමෙන් මේ වනවිට ලැබීමට නියමිත නිර්දේශීත ගාස්තුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලැබී ඇත. පළාත් භාණ්ඩාගාරයෙන් අදාල තොරතුරු විමසා මුදල් ලබා ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය යටතේ දක්වා ඇති අතුරු ව්‍යවස්ථා පනවා නොමැත. පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගෙන ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් වී තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළයුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු 17 ක් හැකිතාක් දුරට ලඟාකර ගැනිම සඳහා 2020 ක්‍රියාකාරී සැලසුම මගින් කටයුතු කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුර නැගුම ව්‍යාපෘතිය මගින් ඉදිකර සභාව වෙත භාරදී තිබුණු කඩ කාමර 46 ක් කුලී පදනම මත ගිවිසුම්ගතව ලබාදී තිබුණු නමුත් අදාළ කඩකාමර සඳහා අයවිය යුතු රු.19,250,000 ක් අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව හිඟ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | කඩකාමර සඳහා අයවිය යුතු හිඟ මුදල් ලබාගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දැනට සභාවේ සේවය නොකරන නිලධාරීන්ගෙන් වසර 01 සිට 20 ක් දක්වා කාලයක සිට අයනොවී පවතින සේවක ණය රු.556,258 ක් විය. | අදාල හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | හිඟ ශේෂ වාරික වශයෙන් අයකර ගැනීමෙන් අයකළ නොහැකි ශේෂ කපාහැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය

නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 03 ක් මාස 03 සිට වසර 10 ක් දක්වා කාලපරිච්ඡේදයක් නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කිරිම හෝ විධිමත්ව අපහරණය කිරීම සිදුකළ යුතුවේ. | ඉදිරියේදී අදාල ගැටළු නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3.5 මතභේදයට තුඩුදුන් කරුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.95,301,489 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම සභාව විසින් පත්කර තිබුණු කමිටුවක තක්සේරුවක් පදනම්ව රු.574,042,740 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම සියයට 502 කින් වැඩිවී තිබුණි. | තක්සේරුව පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති කමිටුවකින් තක්සේරුව සිදුකළ යුතුවේ. | 2019.12.18 දින පැවති විගණන කළමණාකරණ කමිටුවෙන් සාකච්ඡා කර ගත් පරිදි ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරිතුමා ඇතුළු කමිටුවක් මඟින් මැනුම් කටයුතු සිදු කර තාවකාලික තක්සේරුවක් සිදු කර ඇත. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුරැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂයේ එක් විගණන කළමනාකරණ කමිටුවක් පවත්වා ඇත. |

4.2 නොවිසඳි ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වර්ෂයේ වාර්තාව මගින් ඉදිරිපත් කර තිබුණු විසඳී නොමැති රු.3,007,024 ක් වූ විගණන ඡේද 06 ක් තවදුරටත් පැවතුණි. | විගණන විමසුම් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුවේ. | අදාල විමසුම් සම්බන්ධව කටයුතු කිරීම සහ අවශ්‍ය උපදෙස් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ලබා ගැනීමට කටයුතු කර ඇත. |